**සබරගමුව පළාත් සභාව - 2016**

**------------------------------**

සබරගමුව පළාත් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූල ධර්මවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 02. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2017 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

### 2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාළව 2017 ජුලි 25 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුමේ නම | මුළු ගිණුම් | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 27 | 27 | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 24 | 24 | - |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 10 | 09 | 01 |
| (v) | අරමුදල් ගිණුම් | 02 | 02 | - |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 05 | - |
| (vii) | මන්ත්‍රී අත්තිකාරම් ගිණුම් | 02 | 02 | - |
| | එකතුව | 71 | 70 | 01 |

### 2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් යටතේ දක්වා තිබුණු අනුමත අත්තිකාරම් ශේෂය රු. 9,272,038 ක අවාසිදායක ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. 248,000,000 ක සෘජු ප්‍රදාන අරමුදල් ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පළාත් දෙපාර්තමේන්තු වලින් ලැබිය යුතු අග්‍රිම ශේෂයෙහි ඇතුළත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශේෂය රු. 2,303,535 ක් වුවත් එම

දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව අනුව එම ශේෂය රු. 9,686,937 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 7,383,402 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 03 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 1,277,367,735 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 1,264,720,291 ක් වූයෙන් රු. 12,647,444 ක නොසැසඳීමක් විය.

### 2.2.5. අවිනිශ්චිත ගිණුම්

2016 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු 02 කට අදාළව පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල එකතුව රු. 2,371,255 ක් වූ හඳුනා නොගත් ශේෂයක් පැවතුණි.

### 2.2.6 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ලැබියයුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 46,204,305 ක් වූ අතර, ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 3,567,822 ක් විය.

### 2.2.7 පිළිතුරු නොළත් විගණන විමසුම්

2016 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කරන ලද විගණන විමසුම් 22 කට 2017 ජූලි 25 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 369,338,668 ක් විය.

### 2.2.8 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

දින සියයේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින්ගේ සමූපාකාරික හැඟීම් වර්ධනය කර ක්‍රියාකාරීව සමුපකාර සමිතිය සමඟ කටයුතු කිරීම අරමුණු කර ගත් වැඩසටහනට රු. 957,500 ක් වැයකර තිබුණි. එයින් ආහාර වියදම් සඳහා රු. 412,300 ක් හා ප්‍රවාහන වියදම් සඳහා රු. 481,000 ක් ගෙවා තිබුණු අතර, මේ සම්බන්ධව ඉටු කළ කාර්යභාරය තහවුරු කර ගැනීමට අදාළ ලිපි ලේඛන විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

### 2.2.9 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලටඅනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>**නීති,රීති හා රෙගුලාසිවලට යොමුව**</u> | <u>**අනුකූල නොවීම**</u> |
|---|---|
| (අ) **පනත්**<br>**-------** | |
| මහා නගර සභා ආඥා පනතේ(252 අධිකාරිය) 226 (5) හා (6) උප වගන්ති, නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 183 (5) උප වගන්තිය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8) හා (9) උප වගන්ති | අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත එකී තැනැත්තා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාළ මුදල ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා නොමැති නම් හා අභියාචනයක් කර නොමැති නම් අදාළ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීම් කර අදාළ මුදල් අයකර ගැනීමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කළ යුතු වුවත්, එසේ කටයුතු නොකිරීම හේතුවෙන් විගණකාධිපති විසින් අවස්ථා කිහිපයකදී නිකුත් කර තිබුණු අධිභාර සහතිකවලින් 2017 ජුනි 30 දින වනවිට අධිභාර සහතික 6 ක් යටතේ එකතුව රු. 1,929,509 ක් අයකරගෙන නොතිබුණි. |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>**--------------------------------------** | |
| (ආ) | |
| (i) **xix පරිච්ඡේදයේ** 5 වන වගන්තිය | පළාත් සභාවට අයත් රජයේ නිවාස 12 ක 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පදිංචිව සිටි නිලධාරින්ගෙන් යොමුගත විධිවිධානයන්ට පටහැනිව නිවාස කුලී අය කිරීම හේතුවෙන් එකතුව රු. 2,577,548 ක ආදායමක් පළාත් සභාවට අහිමි වී තිබුණි. |
| (ii) **xix පරිච්ඡේදයේ** 7.2 උපවගන්තිය | බදු කාල සීමාව ඉක්මවා රජයේ නිවාසයක පදිංචිව සිටින නිලධාරීන්ගෙන් නිවාස කුලියට අමතරව වැටුපෙන් සියයට 8 ක් සහ එම නිවාසය සඳහා එවකට පවත්නා විවෘත වෙළඳපල කුලිය යන දෙකෙහි එකතුව දණ්ඩන කුලිය වශයෙන් අයකළ යුතු වුවත් 2014 අප්‍රේල් සිට වැටුපෙන් සියයට 8 ක් පමණක් දණ්ඩන කුලිය ලෙස අය කරන අවස්ථා තිබුණි. |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**--------------------------------------** | |
| මු.රෙ.571(3) | ආයතන 05 කට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.39,851,331 වූ තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |

(ඇ) **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**

**---------------------------------------**

| | |
|---|---|
| 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන රාජ්‍ය වියදම් චක්‍රලේඛය | යොමුගත චක්‍රලේඛයේ උපදෙස් වලට පටහැනිව නිකුත්කළ 2009 ජූනි 17 දිනැති අංක ආ.කා. 10/4//3/73/(II) දරන සබරගමුව පළාත් ආණ්ඩුකාරවර චක්‍රලේඛය මත පදනම්ව 2015 ජනවාරි 01 දින සිට 2016 මාර්තු 31 දින දක්වා ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු අමාත්‍යවරුන් වෙත දුරකථන දීමනා ලෙස රු. 1,125,000 ක් ද, උක්ත චක්‍රලේඛය සහ 2009 ජූනි 10 දිනැති අංක එස් 205 දරන සබරගමුව පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා වෙත දුරකථන දීමනා ලෙස එකතුව රු. 1,323,385 ක් ද, උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මත පමණක් පදනම්ව මන්ත්‍රීවරුන් 45 දෙනෙකු වෙත දුරකථන දීමනා ලෙස එකතුව රු. 8,289,290 ක් ද වැඩිපුර ගෙවා තිබුණු අතර යථෝක්ත අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව 2015 ජනවාරි 01 දින සිට 2016 මාර්තු 31 දින දක්වා සබරගමුව පළාත් සභා නියෝජිතයින් 55 දෙනෙකු වෙනුවෙන් රියදුරු සහ ඉන්ධන දීමනා ලෙස එකතුව රු. 35,860,447 ක් ගෙවා තිබුණි. |

(ඉ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

**-----------------------**

| | | |
|---|---|---|
| (i) | 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | විදේශ සංචාර 05 කදී යානා පත්‍ර මිළදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත එකතුව රු. 2,875,936 ක් ගෙවීම් කර තිබූ අතර සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී, එම සමාගමෙන් යානා පත්‍ර මිළදී ගැනීම හේතුවෙන් සංචාර 02 කට අදාළව පමණක් සිදු වී තිබූ මූල්‍යමය අලාභය රු. 1,007,200 ක් විය. |

(ii) 2015 මැයි 15 දිනැති අංක මු.අ 1/2015/1 දරන චක්‍රලේඛය

- 4 (අ) ඡේදය

ප්‍රදායක ආයතනය විසින් නවාතැන්, ආහාරපාන හා අනෙකුත් පහසුකම් ලබා දෙන බව දන්වා තිබූ විදේශ සංචාර 03 ක් සඳහා සංයුක්ත දීමනා වශයෙන් එකතුව රු. 4,009,789 ක් ප්‍රධාන අමාත්‍යවරයා, ඔහුගේ පෞද්ගලික ලේකම්, අධ්‍යාපන අමාත්‍යවරයා හා නිලධාරීන් 04 දෙනෙකු වෙත ගෙවීම් කර තිබුණු අතර එක් සංචාරයකදී ප්‍රධාන අමාත්‍යවරයා හා පෞද්ගලික ලේකම් වෙත පමණක් එකතුව රු. 810,776 ක් වැඩිපුර සංයුක්ත දීමනා ගෙවීම් කර තිබුණි.

- 3 (ආ) ඡේදය

විදේශ සංචාර 02 කදී පළාත් අමාත්‍යවරු 03 ක් හා නිලධාරීන් 19 ක් වෙත අනියම් දීමනා වශයෙන් රු. 1,001,183 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

- 05 ඡේදය

නිල චාරිකාවක දී දූත පිරිසට නායකත්වය දෙන අමාත්‍යවරයාගේ හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි ඇ.එ.ජ. ඩොලර් 750 ක් දක්වා වූ මුදලක් සංග්‍රහ දීමනා ලෙස ගෙවිය හැකි වුවත් 2016 අගෝස්තු 14 දින සිට 20 දින දක්වා වූ තායිලන්ත සංචාරයේදී ප්‍රධාන අමාත්‍යවරයා හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත සංග්‍රහ දීමනා ලෙස ඇ.ඩො. 750 ක් බැගින් එකතුව ඇ.ඩො.1500 ක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව රු. 111,352 ක් (ඇ.ඩො. 750 ක්) වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) **වෙනත් චක්‍රලේඛ**

**--------------------**

(i) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2015 මාර්තු 25 දිනැති අංක SEC/2015/02 දරන චක්‍රලේඛයේ 02 11 (අ) ඡේදය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2015 සහ 2016 වර්ෂ සඳහා බැංකුව විසින් අයකර තිබූ එකතුව රු. 117,045 ක් වූ රඳවා ගැනීමේ බදු නැවත ආයතනය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) **2007 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය**
**---------------------------------------**

(i) 61 (1) වගන්තිය — සමූපකාර සංවර්ධන අරමුදල සම්බන්ධයෙන් අවශ්‍ය රීති සකස් කර අනුමත කර ගැසට් පත්‍රයේ පළ කළ යුතු වුවත්, 2016 සැප්තැම්බර් දක්වා එම කාර්ය ඉටුකර නොතිබුණි.

(ii) 43(ආ) වගන්තිය — සෑම ලියාපදිංචි සමිතියක් විසින්ම සමිතියේ කටයුතු වලට අදාළ ගිණුම් හා සංඛ්‍යා පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්ෂික අවසාන ගිණුම හා ශේෂ පත්‍රයක් සකස් කර අදාළ මුදල් වර්ෂය අවසාන වී මාස 03 ක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි සමුපකාර ණය දෙන සමිති 300 කින් සමිති 295 ක් 2015 වර්ෂයට අදාළ ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.10.** **<u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සි/ස කෑගල්ල රංවල පේෂ කාර්මිකයින්ගේ සමුපකාර සමිතියට අයත් ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. 8,464,950 ක් වැයකර තිබුණි.

(ආ) ජනාධිපති ලේකම්ගේ 2015 ජුනි 05 දිනැති අංක සීඑස්ජ්/1/1/83 දරන චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව නිකුත් කළ ආණ්ඩුකාරවර ලේකම්ගේ 2016 මාර්තු 02 දිනැති අංක ආකා 8/1 දරන ලිපිය මගින් ජනාධිපතිතුමාගේ අනුමැතියට යටත්ව සිය අනුමැතිය ලබා දී සබරගමුව පළාත් සභාවේ අමාත්‍යවරු 02 ක්, මන්ත්‍රීවරු 24ක් හා තෝරාගත් නිලධාරීන් 07 ක් ඇතුළුව 33 දෙනෙකුට ඉතාලියේ සංචාරය කිරීම වෙනුවෙන් පළාත් සභා අරමුදලෙන් රු. 20,645,477 ක් වියදම් කර තිබුණි.

## 03. <u>ආදායම් කළමනාකරණය</u>

### 3.1 <u>ඉකුත් වර්ෂ 05 ක ආදායමේ උපනතිය</u>

ඉකුත් වර්ෂ 5 තුළ දී පළාත් සභාව විසින් එකතු කරන ලද බදු ආදායම සහ බදු නොවන ආදායම පහත පරිදි වේ.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම |
|---|---|---|
| | රු. | රු. |
| 2011 | 1,943,637,444 | 416,079,145 |
| 2012 | 2,007,749,583 | 496,404,402 |
| 2013 | 2,163,127,948 | 496,200,284 |

| | | |
|---|---|---|
| 2014 | 2,394,497,366 | 676,362,034 |
| 2015 | 2,832,257,548 | 725,367,341 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කැගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක 2016 වර්ෂය තුළ එකතුව රු. 4,814,632 ක වාර්ෂික බදු, දීර්ඝකාලීන බදු, එලදා බදු හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යටන්වල ගමේ අංක 2852 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ඉඩම 1983 වර්ෂයේ සිට දිගුකාලීන බදු පදනම මත ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත බදු දී තිබූ අතර, 2002 වර්ෂයේ සිට දීර්ඝකාලීන බදු ලෙස රු. 1,755,040 ක් අයවිය යුතුව තිබුණි. තවද ටෙලිකොම් ආයතනය විසින් ඉඩමේ අයිතිය එම ආයතනයට ඇති බවට නීතිමය කරුණු දක්වා තිබුණ ද මෙතෙක් එම ගැටලුව විසඳා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂයේ තත්‍ය ආදායම පිළිබඳව සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් ආදායම් ශීර්ෂ 09 ක ට අදාළව රු. 760,338,155 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 29 ට අදාළ එකතුව රු. 267,131,080 ක් වූ හිඟ ආදායම් ශේෂයක් පැවති අතර, එය ඉකුත් වර්ෂයට වඩා සියයට 28.5 ක වැඩිවීමක් විය.

## 04 මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 1,816,974,306 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 238,561,212 ක් විය. ඒ අනුව රු. 2,055,535,518 ක පිරිහීමක් නිරීක්ෂණය වූ අතර අරමුදල සතු මූල්‍ය වත්කම් උපලබ්ධි කර වියදම් දරා තිබීම මීට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 4.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 11 කට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පනවා තිබූ නෛතික සිද්ධි 221 ක් සහ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 05 ක් විසින් බාහිර පාර්ශවයන් වෙත පනවා තිබූ නෛතික සිද්ධි 100 ක් 2016 දෙසැම්බර් වන විටත් විභාග වෙමින් පැවැතුණි.

### 4.3 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම 2015 වර්ෂයේ වියදම සමඟ සංසන්දනය කිරීමේ දී පුනරාවර්තන වැය විෂයයන් 05 කට අදාළව සියයට 37 සිට සියයට 208 දක්වා පරාසයකින් වැඩි වී තිබුණි.

**05** **අධිකාරි ගිණුම්**

**සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) එකතුකළ අගයමත බදු (VAT) නොගෙවිය යුතු කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් වෙන්කර තිබූ එකතුකළ අගය මත බදු (VAT) රු. 2,020,898 ක් පළාත් සභාව සඳහා ගෙවිය යුතු බදු ලෙස වගකීම් යටතේ දක්වා තිබූ නමුත්, එම මුදල් පළාත් සභාව වෙත නිරවුල් කර නොතිබුණි.

(ii) රු. 1,370,000 ක වියදමක් දරා 2012 වර්ෂයේ දී මිළදී ගෙන තිබුණු ජංගම (Parabolic) වේදිකාවක් අධිකාරිය සතු වුවත්, 2015 වර්ෂය තුළ ඉන් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

**06.** **මෙහෙයුම් සමාලෝචනය**

**6.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා ලේකම් කාර්යාලයේ මන්ත්‍රී සංචාරක නිල නිවාසයෙහි කාමර වෙන් කිරීම සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණු අතර කිසිදු ගාස්තුවක් අය කිරීමෙන් තොරව පළාත තුළ මෙන්ම පළාතෙන් බැහැර මන්ත්‍රීවරුන් සහ ඔවුන් විසින් නම් කරන ලද කණ්ඩායම් සඳහා රාජකාරිමය මෙන්ම පෞද්ගලික අවශ්‍යතා වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර තිබූ අවස්ථා තිබුණි. සංචාරක නිල නිවාසය පවත්වා ගැනීම සහ නඩත්තු කිරීම සඳහා ආසන්න වශයෙන් වාර්ෂිකව රු. 1,000,000 ක පමණ පිරිවැයක් දරා තිබුණ අතර ඵලදායි අරමුණු වෙනුවෙන් නිසි කළමනාකරණයකින් යුතුව ක්‍රියාත්මක වී නොතිබීම හේතුවෙන් වාර්ෂිකව අධික වැය බරක් පළාත් සභාවට දැරීමට සිදුව තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ 2007 දෙසැම්බර් 13 දිනැති 2007/20 අංක දරන චක්‍රලේඛයේ 3.2 ඡේදය අනුව වඩාත් පහසු පාසලක වසර 06 ක් හා පහසු පාසලක වසර 08 ක් ලෙස උපරිම සේවා කාලය තීරණය කර තිබුණ ද, සබරගමුව පළාත තුළ පාසල් 644 ක එම කාල සීමාව ඉක්මවා වසර 8 සිට 34 දක්වා කාල සීමාවක් එකම පාසලේ සේවය කරන ගුරුභවතුන් 3,274 ක් විය.

(ඇ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවති අයවිය යුතු රු. 8,741,879 ක බදු ආදායම 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2005 හා 2006 වර්ෂ වලදී තැන්පත් කරන ලද එකතුව රු. 6,000,000 ක ස්ථාවර තැන්පතු වර්ෂ 10 ත් 11 ත් අතර කාල පරාසයක් තුළ ඵලදායී කටයුත්තකට යොදා ගැනීමකින් තොරව පැවතුණි.

(ඉ) සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පළාත් පාලන හා සෞඛ්‍ය කටයුතු වලට සම්බන්ධ ඉහළ කළමනාකාරීත්වය සමඟ 2016 ජූලි 27 දින පවත්වන ලද සබරගමුව පළාත් විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන පිළිබඳ රැස්වීම් වාර්තාවේ තීරණ අංක 01 පරිදි නොදිරන කසල ගබඩා කිරීමට පහසුකම් නොමැති පළාත් පාලන ආයතන වලට ගබඩා පහසුකම් සඳහා ගොඩනැගිලි ඉදිකර දීමට තීරණය

කර තිබුණද, 2017 ජූනි 30 දින වනවිටද සබරගමුව පළාතේ ගබඩා පහසුකම් නොමැති පළාත් පාලන ආයතන 12 ක් සඳහා ගබඩා පහසුකම් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

**6.2** **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට අයත් රජයේ නිවාස 08 ක් දීර්ඝ කාලයක් තිස්සේ පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණද, එම අනවසර පදිංචිකරුවන් නිවාස වලින් ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් පියවරගෙන නොතිබුණි.

(ආ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු විවිධ අරමුදල් වලට අයත් බැංකු ගිණුම් 07 ක 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 24,318,986 ක ශේෂයක් වූ අතර ස්ථාවර තැන්පත් 36 ක රු. 145,650,343 ක ශේෂයක් විය. එම අරමුදල් ආරම්භයේ සිට මේ දක්වා ගිණුම් සකස් කර නොතිබුණ අතර, මෙම ශේෂ කිසිවක් පළාත් සභා අරමුදල් ගිණුමට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට ලියාපදිංචිය අවලංගු කර තිබුණු සමුපකාර ණය දෙන සමිති 48 ක ඈවර කටයුතු 2016 අගෝස්තු 25 දින වනවිටත් අවසන් කර නොතිබුණු අතර, 2016 අගෝස්තු 03 දින සමුළු වාර්තාව අනුව කෑගල්ල සමූපකාර උප කොමසාරිස් කාර්යාලයට අයත් සමිති 74 ක් ඈවර කිරීමට තීරණය කර තිබුණි. අදාළ සමිතිවල ඈවර කිරීමේ කටයුතු ඉතා මන්දගාමී මට්ටමක පැවතුණු අතර ඈවර කළ යුතු අක්‍රීය මට්ටමේ පවතින සමුපකාර සමිති ගණන 425 ක් විය.

(ඈ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් රජයේ නිවාස පිහිටා ඇති භූමියෙන් කොටසක් ආසන්න පදිංචිකරුවන් 04 දෙනෙකු විසින් අත්පත් කරගෙන තිබුණද, එම භූමිය නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත තුළ තෝරාගත් පාසල් 15 ක එකතුව රු.133,287,704 ක වියදමින් මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකර තිබුණු අතර ඉදිකිරීම් නිමකර වසර දෙකකට වැඩි කාලයක් ගතව තිබූ තාක්ෂණික විද්‍යාගාර 5 ක් 2017 මාර්තු වනවිටත් නිල වශයෙන් සිසු අයිතියට පත්කර නොතිබුණි.

(ඊ) මහින්දෝදය විද්‍යාගාර සඳහා 2015 වර්ෂය තුළ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු. 83,500,000 ක් වූ පරිගණක හා උපාංග, පුටු හා මේස ඇතුළු උපකරණ වර්ග 25 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටද මිලදී ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එම උපකරණ ලැබී නොමැති පාසල් වල තාක්ෂණික විද්‍යාගාර ඌන උපයෝජිතව පැවතුණි.

**6.3** <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

පහත කරුණු නිරීක්ෂණයවිය.

(අ) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාත් සභාව වෙත භාරදී ඇතැයි සැලකෙන ජීප් රථයක ලියාපදිංචිය සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු පරීක්ෂා කිරීමේදී එම වාහන අංකය සහිත වෙනත් වාහනයක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් පැවැරුම් ලැබූ පෞද්ගලික හිමිකාරීත්වයක් යටතේ ඇති බව අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධව ඉඩම් කොමසාරිස් ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දැනුවත් කර තිබුණ ද රජයට අයත් සහ භෞතිකව තවමත් සබරගමුව පළාත් සභාව තුළ පවතින වාහනයක් ලිඛිතව වෙනත් පුද්ගලික පාර්ශවයක් වෙත පවරා තිබීම හා එම පාර්ශවය විසින් එම අංකය යටතේ ව්‍යාජ වාහනයක් භාවිතා කිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. වාහනයේ හිමිකාරීත්වය පිළිබඳ මතුව ඇති ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් පළාත් සභාවට අයත් වාහනය ධාවන තත්ත්වයේ තිබිය දී 2014 දෙසැම්බර් 26 දින සිට සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ ගාල්කර තිබුණි.

(ආ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය හා දිරි දීමනා යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

(i) පිරිවැටුම් බදු ආදායම 2011 වර්ෂයේ සිට පළාත් සභාවලට අහිමි වීමත් සමග සෙසු පළාත් සභා තම පළාත් ආදායම් නිලධාරීන්ගේ දිරි දීමනා යෝජනා ක්‍රම තාවකාලිකව අත්හිටුවීමට හා සංශෝධනය කිරීමට පියවර ගෙන තිබුණු අතර මුදල් කොමිෂන් සභා සභාපතිගේ 2011 පෙබරවාරි 09 දිනැති, අංක FC/BE/REV/2011 දරන ලිපිය අනුව භාණ්ඩාගාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2011 මාර්තු 07 දින පැවති සාකච්ඡාවේදී තීරණය කරන ලද පරිදි පළාත් ආදායම් නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමවේදයක් සකස් කර ගැනීමට උපදෙස් ලබා දී තිබුණි. එහෙත් සබරගමුව පළාත් සභාව විසින් එම උපදෙස් වලට පටහැනිව පෙර පැවති යෝජනා ක්‍රමයම අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි.

(ii) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඍජු දායකත්වයෙන් 2014 හා 2015 වර්ෂ දෙකෙහි නැවත තක්සේරු කිරීම් මත රැස්කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම සහ ඖෂධ, රසායන හා ඛනිජ බදු ආදායම් වල එකතුව පිළිවෙලින් රු. 18,754,862 ක් හා රු. 30,843,651 ක් වූ අතර එම වර්ෂ දෙකෙහි දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත ගෙවීම් කර ඇති දිරි දීමනා වියදම පිළිවෙලින් රු. 10,198,484 ක් හා රු. 11,757,295 ක් විය. මෙම දිරි දීමනාව ගෙවීමේදී නිලධාරීන්ගේ ඍජු දායකත්වය මත ඉපයූ බදු ආදායම නොසලකා, රැස් කළ සමස්ථ ආදායම මත දිරි දීමනා ගෙවා තිබුණි.

(iii) පළාත් සභාවේ ආදායම් අඩුවීමට පිළියම් යෙදීම පිණිස පළාත් සභාවට නීතියෙන් අයවීමට ඇති විවිධ බදු වර්ග හා ආදායම් අයකර ගැනීමටත්, නොයෙකුත් හේතු මත අය නොවන හා එකතු නොවන බදු හා ආදායම් රැස් කිරීමට පියවර ගැනීම සඳහාත් විශේෂ ස්ථාවර කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව පිහිටුවා වසර 04 ක් ඉක්ම ගොස් තිබූ

නමුත්, පළාත් ආදායම් ජනනය හා ප්‍රවර්ධනය වෙනුවෙන් ඉටුකරන ලද කාර්ය සාධනයක් නොවීම හේතුවෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තු දිරි දීමනා යෝජනා ක්‍රමය යටතේ 2013 දෙවන අර්ධ වර්ෂයේ සිට 2016 ප්‍රථම අර්ධ වර්ෂය දක්වා කාලසීමාව වෙනුවෙන් මෙම කමිටු සාමාජිකයන් වෙත ගෙවීම් කර තිබුණු එකතුව රු. 1,248,656 ක් වූ දිරි දීමනා නිෂ්ඵල වියදම් වී තිබුණි.

(ඇ) පළාත් පරිවාස හා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අක්ෂි සායන වලදී තෝරාගත් අක්ෂි දුර්වලතාවයන්ගෙන් පෙළෙන පුද්ගලයන් වෙත ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 1,683,750 ක් වැයකර ඇස් කණ්ණාඩි 2,245 ක් මිලදීගෙන තිබුණි.එම ඇස් කණ්නාඩි පිරිවිතර වලට අනුකූලව සපයා ඇති බවට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ගොනුගත කර තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සිටි විෂයය පිළිබඳ ප්‍රවීණතාව සහිත නිලධාරියා විසින් ඒවා පරික්ෂා නොකළ බව විගණනයට තහවුරු විය. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා වල නිර්ව්‍යාජ බව විගණනයේදී මතභේදාත්මක විය.

(ඈ) 2007 ඔක්තෝබර් 23 දිනැති අංක 23/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පදනම් කර ගනිමින් අධ්‍යාපන අමාත්‍යවරයාගේ කාර්යය මණ්ඩලය වෙත වෙන්කර තිබූ වාහන 02 ක් අනතුරු හේතුවෙන් අළුත් වැඩියාවන්ට යොමුකර තිබූ කාල සීමාවන් වෙනුවෙන් මාසික ප්‍රවාහන දීමනාවන් හි එකතුව ලෙස රු. 420,000 ක් 2015 දෙසැම්බර් 31 දින අධ්‍යාපන අමාත්‍යවරයා වෙත ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද අමාත්‍යවරයාගේ ඉල්ලීම මත එම දීමනාව අදාළ නිලධාරීන් වෙත ගෙවීම් නොකර අමාත්‍යවරයා වෙත ගෙවීම් කළ බවට විගණනය වෙත පිළිතුරු දී තිබුණි.

6.4 <u>අවිධිමත් ගණුදෙනු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ග අමාත්‍යාංශයේ මැදිහත් වීමකින් තොරව පවත්වා තිබූ අමාත්‍යවරයාගේ ජනහමු හා රැස්වීම් වෙනුවෙන් දරන ලද වියදම් ලෙස රු. 1,936,225 ක චෙක්පතක් ආදායකයා වෙත නිකුත් කිරීමකින් තොරව අමාත්‍යවරයාගේ නමට හා එකතුව රු. 856,594 ක චෙක්පතක් සම්බන්ධීකරණ ලේකම්වරයාගේ නමට නිකුත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එකතුව රු. 1,897,607 ක් වැයකර වැඩමුළු දෙකක් පවත්වා තිබූ අතර එම වැඩමුළු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම පිණිස ආයතන තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම, ව්‍යාජ ලේඛන පිළියෙළ කිරීම හා චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව ගෙවීම් කිරීම නිරීක්ෂණය විය.

(ඇ) 2015 වර්ෂයේ දී ආණ්ඩුකාරවරයා විසින් විවිධ පාර්ශවයන් වෙත තිළිණ වශයෙන් බෙදාහැරි විවිධ භාණ්ඩ සඳහා රු. 4,074,115 ක් වැයකර තිබුණි.

(ඈ) රත්නපුර කලාපයේ පාසල් සිසුන් වෙත ඇස් කණ්ණාඩි 171 ක් බෙදා දීම සඳහා රු. 299,250 ක් වැයකර තිබුණ ද, එම සැපයුමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමේදී 2006

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) අනුව විෂයය පිළිබඳව විශේෂඥතාවය සහිත නිලධාරියෙක් පත්කර නොතිබුණු අතර එම කමිටුව විසින් අදාළ රෝග නිශ්චය පත්‍රිකාවේ කරුණු හා මූලික පිරිවිතර සමග ඇස් කණ්ණාඩි සඳහා නිර්දේශයක් ලබා දීමද සිදු කර නොතිබුණි. තවද, සිසුන් තෝරා ගැනීම වෛද්‍යවරයෙකුගේ මගපෙන්වීම හා එකගතාවය මත සිදු කිරීමෙන් තොරව ඇස් කණ්ණාඩි සැපයුම්කරු වෙතම පවරා තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියට සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දීම සඳහා ක්‍රීඩා ඇඳුම් කට්ටල 300 ක් මිලදී ගැනීමේදී කල්තියා සැලසුම් සකස් නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ක්‍රීඩා ඇඳුම් කට්ටල මිලදී ගැනීමට සිදුව තිබූ අතර ක්‍රීඩකයින් 30 කට ඇඳුම් කට්ටල ලැබී නොතිබුණි. අදාළ ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමට පෙර හා ගෙවීම් කිරීමට පෙර ක්‍රීඩා ඇඳුම් නියමිත පිරිවිතර වලට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබාගෙන නොතිබුණු අතර එවැනි සහතිකයකින් තොරව රු. 252,000 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවීම් කර තිබුණි.

6.5 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත තුළ විවිධ ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා අවස්ථාවන් ලබාගැනීමේ අරමුණින් පළාත් ප්‍රධාන අමාත්‍යවරයා හා ඔහුගේ පෞද්ගලික ලේකම්වරිය 2015 හා 2016 වර්ෂ දෙක තුළ සිදුකර තිබූ විදේශ සංචාර දෙකක් හා පළාත් සමාජ සුභ සාධන හා කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා 2015 වර්ෂය තුළ සිදුකර තිබූ එක් විදේශ සංචාරයක් සඳහා පළාත් සභා අරමුදලින් එකතුව රු. 4,335,078 ක් වැයකර තිබුණ ද එමගින් සබරගමුව පළාතට අත්වූ ප්‍රතිලාභ කිසිවක් 2017 ජුනි 30 දින වන විටත් හඳුනාගත නොහැකි විය.

(ආ) වෛද්‍ය ක්ෂේත්‍ර පරිපාලනයේ නියැලෙන වෛද්‍ය නිලධාරින් පුහුණු කිරීමේ වැඩ සටහනක් සඳහා එක්සත් රාජධානියේ පෞද්ගලික රෝහලකින් කරන ලද ආරාධනයකට අනුව 2016 මාර්තු 27 දින සිට අප්‍රේල් 03 දින දක්වා, වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ කිසිදු නිලධාරියෙකුගේ සහභාගිත්වයෙන් තොරව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහ ඔහුගේ පෞද්ගලික ලේකම්වරිය කරන ලද එම විදේශ සංචාරය සඳහා එකතුව රු. 1,669,884 ක් පළාත් සභා අරමුදලින් වැය කර තිබුණි.

(ඇ) 2016 ජූලි 07 දින සභා ලේකම් කාර්යාලයේ මන්ත්‍රී සංචාරක නිවාසයෙහි සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී 2014 හා 2015 වර්ෂයන්ට අදාළ භාවිතයට නොගත් වටිනාකම රු. 369,338 ක් වූ දින පොත් 2,092 ක් තැන්පත් කර තිබීම නිරීක්ෂණය විය.

(ඈ) සබරගමුව පළාත් සභාව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන් දෙදෙනෙකු 2014 පෙබරවාරි සිට 2016 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාරගතව සිට ඇති අතර , එකී කාලය තුළ පළාත් සභාව මගින් පැවැත්වූ සභා රැස්වීම් කිසිවකට හෝ සහභාගී වී නොතිබුණි. බන්ධනාගාර

ගතව සිටි කාලය තුළ පළාත් සභාව වෙත ඔවුන්ගේ  සේවය ලැබී නොතිබුණ ද එම කාලපරිච්ඡේදය සඳහා වැටුපට අමතරව රියදුරු දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා සහ සංග්‍රහ දීමනා වෙනුවෙන් එකතුව රු. 1,191,507 ක් ගෙවා තිබුණි.

**6.6 දෘශ්‍ය වංචනික ගණුදෙනු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සබරගමුව පළාත් සභා මන්ත්‍රී නිල නිවාසය අලුත්වැඩියාව හා නවීකරණ කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේදී රු. 4,921,776 ක් වැයකර තිබූ අතර ඇස්තමේන්තු සකස් කිරීම, අනුමත කිරීම හා ගෙවීම් කිරීමේදී සිදුව තිබූ දුර්වලතා හා අක්‍රමිකතා හේතුවෙන් පළාත් සභා අරමුදලට රු.1,975,627 ක පාඩුවක් සිදුව තිබුණි. අදාළ පාඩුව කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට තීරණය කරන ලදුව ඒ බව ලිඛිතව කොන්ත්‍රාත්කරු වෙත දන්වා  තිබුණ ද ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) “ළඟම පාසල හොඳම පාසල” ව්‍යාපෘතිය යටතේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා අත්තිකාරම් වශයෙන් රු. 239,277 ක් ර/ඇඹි/පනාවල විද්‍යාලයේ පාසල් සංවර්ධන ගිණුමට බැර කර තිබූ අතර ඉන් රු. 200,000 ක් විදුහල්පතිවරයා විසින් 2016 නොවැම්බර් 29 දින ලබා ගෙන තිබුණි.ස්ථානීය පරික්ෂාව සිදුකළ 2017 ජනවාරි 26 දින වනවිටත් ඉදිකිරීම් ආරම්භකර නොතිබුණු අතර  අදාළ මුදල් වහාම ආපසු ගෙවන ලෙසට කලාප අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණද 2017 ජූලි 25 දින තෙක් එම මුදල් විද්‍යාලීය ගිණුමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි.

**6.7 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පළාත් සභාවට අයත් විවිධ ආයතනයන්හි  වටිනාකම රු.112,400 ක් වූ යන්ත්‍රෝපකරණ 10 ක් වර්ෂ 6 ක සිටද, වටිනාකම හඳුනානොගත් යන්ත්‍රෝපකරණ 146 ක් මාස 9 සිට වර්ෂ 12 දක්වා කාල පරාසයක සිටද, ගොඩනැගිලි 4 ක් වර්ෂ 1 සිට වර්ෂ 5 කාල පරාසයක සිටද, වටිනාකම සහ නිෂ්ක්‍රීය කාලය හඳුනාගත නොහැකි ගොඩනැගිලි 12 ක් හා වාහන 02 ක් ද  නිෂ්ක්‍රීයව පැවතුණි.

**6.8 හඳුනා ගන්නා ලද පාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා වෙත වෙන්කර තිබූ නිල රථය 2012 ඔක්තෝබර් 05 දින අනතුරකට ලක්ව තිබුණ ද, 2016 ජුලි 25 දින වන විටත් අලුත්වැඩියා කර නොතිබුණි. අනතුරට පත් රථයේ රියදුරු විසින් අනතුර සිදුවූවා යැයි වාර්තා කර ඇති ආකාරයට  එදින එම ස්ථානයේදී එවැනි අනතුරක් සිදු ව ඇති බවට තහවුරු නොවීමත්, වාහනයට සිදු වී ඇති අලාභය, අනතුර හා අනුකූල නොවීමත් හේතුවෙන් හානි ප්‍රතිපූර්ණය කිරීම රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද  රක්ෂණ සමාගම වෙත වසර 3ක් තිස්සේ  කරන ලද ඉල්ලීම් සලකා මෙම අනතුර සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීමක් නැතත් පළාත් සභාව ඔවුන්ගේ යහපත් පාරිභෝගික ආයතනයක් වන බැවින් රු. 250,000 ක හිමිකමක් ගෙවීමට 2015 ඔක්තෝබර් 13 දින රක්ෂණ

සමාගම එකඟවී තිබුණි. එහෙත් රු. 566,426 ක් වූ මුල් අළුත්වැඩියා ඇස්තමේන්තුව 2015 ඔක්තෝබර් වන විට රු. 1,149,681 ක් දක්වා වැඩි වී තිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 54.1.3 අනුව අලාභ හානි සම්බන්ධයෙන් වහාම පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කළයුතු වුවද, ඉහත (අ) ඡේදයෙහි සඳහන් අනතුර සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් අනතුර සිදු වී මාස 21 කට පසුව 2014 අගෝස්තු 18 දින නිලධාරීන් පත්කර තිබුණු අතර විමර්ශනය සිදුකළ නිලධාරීන් ඒ සඳහා මාස 15 ක කාලයක් ගතකර තිබුණි. මූලික විමර්ශන කමිටුව විසින් අලාභය රියදුරුගෙන් අයකළයුතු බව නිර්දේශ කර තිබුණද 2017 ජුනි 12 දින තෙක් අලාභය අයකර නොතිබුණි. තවද, අදාළ කාල සීමාව තුළ අමාත්‍යවරයා වෙත වෙනත් නිල වාහනයක් ලබාදීම වෙනුවට 2007 ඔක්තෝබර් 23 දිනැති හා අංක 23/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මත පදනම්ව 2012 ඔක්තෝබර් සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රවාහන දීමනා වශයෙන් එකතුව රු. 1,080,000 ක් ගෙවීම් කර තිබුණි. අනතුරට පත් වාහනය සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර වගකිව යුත්තන් නිශ්චය කරමින් අප්‍රමාදව වාහනය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම, චක්‍රලේඛ විධිවිධානයන් නිවැරදිව අර්ථකථනය නොකිරීම සහ රජයට වඩාත් පිරිමැසුම්දායී අයුරින් ක්‍රියා නොකිරීම හේතුවෙන් පළාත් සභාවට සිදුව තිබූ සමස්ත මූල්‍යමය අලාභය රු. 1,979,681 ක් විය.

(ඇ) 2013 මාර්තු 01 දින සිට 2016 පෙබරවාරි 29 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා විදේශ ගත වූ කායික රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු ගිවිසුම්ගත කාලය අවසානයේ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සේවය හැර ගියා සේ සලකා කටයුතු කර තිබුණ ද ගිවිසුම් කඩකිරීම මත එම නිලධාරියාගෙන් රජයට අයවිය යුතුව තිබූ රු. 984,353 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ජීප්රථයක් අනතුරට පත් වීම හේතුවෙන් රු.522,000 ක ඇස්තමේන්තුවක් මත අලුත්වැඩියාව සඳහා 2014 මැයි මස පෞද්ගලික ආයතනයක් වෙත යොමුකර තිබුණ ද, පසුවිපරම් නොකිරීම හේතුවෙන් 2016 ජනවාරි වන තෙක් වාහනය අලුත්වැඩියා කර නොතිබුණි. පසුව එම ආයතනය වාහනය අලුත්වැඩියා කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් රු. 987,500 ක් වැයකර වෙනත් ආයතනයකින් අලුත්වැඩියා කර තිබූ අතර සිදුව තිබූ මූල්‍යමය අලාභය රු. 465,500 ක් විය.

**6.9** <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණයවිය.

(අ) බලංගොඩ කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේදී බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයේ කාර්මික නිලධාරී සහ කොන්ත්‍රාත්කරු සමග එක්ව පිළියෙල කරන ලද ද්විත්ව මිනුම් වාර්තා පදනම් කර ගනිමින් සකස් කරන ලද කළ වැඩ වටිනාකම රු.26,029,799ක් වූ පස්වැනි අතුරු බිල්පත බලංගොඩ විධායක ඉංජිනේරු විසින් නිර්දේශ කර අනුමැතිය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාසල් ගොඩනැගිලි), පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයේ

නිලධාරින්ගේ අනු දැනුමකින් තොරව එම බිල්පතේ වැඩ විෂයයන් 12 ක ඒකක මිල ගණන් (BOQ Rates) වැඩිවන ලෙස වෙනස් කර බිල්පතේ කළ වැඩ වටිනාකම රු. 27,467,263 ක් ලෙස සංශෝධනය කර රු. 1,442,944 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද කළ වැඩ වටිනාකම රු. 26,493,071 ක් වූ අවසාන බිල්පතේ වැඩ විෂයයන් 15 ක ඒකක මිල ගණන් (BOQ Rates) වැඩිවන ලෙස වෙනස් කර කළ වැඩ වටිනාකම රු. 28,437,379 ක් ලෙස සංශෝධනය කර රු. 1,007,589 ක් වැඩිපුර ගෙවීම සඳහා අනුමත කර සහ සහතික කර තිබූ බව අනාවරණය විය.

(ආ) ඉඩම් හා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හිඟුර කුඹුරයායේ පැණිකොළආර ආරක්ෂිත පැතිබැම්ම රු. 1,032,307ක් වැයකර ඉදිකර තිබුණ ද එමගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. ශක්‍යතා වාර්තාව අනුව මෙම බැම්ම ඉදිකිරීමෙන් කුඹුරු අක්කර 10 කට පමණ සිදුවන හානිය වලක්වා ගත හැකි බව සඳහන් කර තිබුණ ද, පැති බැම්ම දිගේ ජලය ගලාගෙන විත් බැම්ම කෙලවරෙන් නැවත කුඹුරට ඇතුල්වීම නිසා බැම්ම ඉදිකිරීමට පෙර කුඹුරට සිදු වූ හානිය ඉදිකිරීමෙන් පසුවද එලෙසම පැවතුණි.

## 6.10 ප්‍රමාද වූ ව්‍යාපෘති

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 03 ක් විසින් ක්‍රියාත්මක කර තිබූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 171ක් විවිධ හේතූන් නිසා ප්‍රමාදවී තිබූ අතර, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 06 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් 310 ක් ආරම්භ නොකර සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

## 6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

### 6.11.1 අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා

(අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාතේ පාසල් වල වර්තමාන ගුරු අවශ්‍යතාවයන් සලකා සකස් කර තිබූ යෝග්‍ය ගුරු සංඛ්‍යාව සමඟ සැසඳීමේදී ප්‍රධාන විෂයයන් සම්බන්ධයෙන් ගුරු ඌනතා සහ අතිරික්තතා පැවතුණි. විස්තර පහත දැක්වේ.

**6-11 ද්විතීක අංශය**

| විෂයය | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|
| ඉංග්‍රීසි | 161 | 79 |
| තාක්ෂණ විෂයය | 633 | 52 |
| විද්‍යාව | 171 | 65 |
| ගණිතය | 186 | 67 |
| වෙනත් විෂයයන් | 1433 | 334 |

**12-13 උසස් පෙළ අංශය**

| විෂයය | ඌනතාවය | අතිරික්තය |
|---|---|---|
| විද්‍යා හා අතිරේක විෂයයන් | 41 | 24 |
| වාණිජ විෂයයන් | 33 | 43 |
| කලා විෂයයන් | 37 | 163 |
| තාක්ෂණ විෂයයන් | 35 | 3 |

(ආ) පළාත තුළ එක් එක් විෂයයන් අනුව සමස්ත ගුරු ඌනතාවය 4,152 ක් වූ අතර ගුරු අතිරික්තය 1,174 ක් විය.

(ඇ) මාවනැල්ල අධ්‍යාපන කලාපයේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ගුරුවරුන් 484 ක් රසායනාගාර සහායකයින් 9 ක් සහ පාසල් කම්කරු හා සනීපාරක්ෂක කම්කරුවන් 9 ක් සේවයේ යොදවාගෙන තිබුණි.

### 6.11.2 <u>සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා</u>

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවය, විවිධ ආයතන මට්ටමින් පහත දැක්වේ.

| | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | ඇඹිලිපිටිය රෝහල | |
|---|---|---|---|---|---|---|---|---|
| | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය |
| වෛද්‍ය | - | 4 | - | 92 | - | 35 | - | 8 |
| හෙද | - | 1 | - | 117 | 20 | 19 | - | 56 |
| ඖෂධවේදී | - | - | - | - | - | 7 | - | 5 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | - | - | - | 29 | - | 4 | - | - |
| පවුල් සෞඛ්‍ය සේවක | - | - | - | 150 | - | 104 | - | 9 |
| ඖෂධ සංයෝජක | - | - | - | 31 | - | 10 | - | 1 |
| උපස්ථායක | - | - | - | 25 | - | 39 | - | 26 |
| වෛද්‍ය රසායනාගාර ශිල්පී | - | - | - | 18 | - | 6 | - | 2 |
| කීට විද්‍යා සහායක | - | - | - | 14 | - | 7 | - | - |
| රියදුරු | - | - | - | 19 | - | 14 | - | 2 |
| මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි | 1 | - | - | 13 | 10 | - | - | - |
| පාසල් දන්ත චිකිත්සක | - | - | - | 17 | - | 4 | - | - |
| මුරකරු | - | - | - | 51 | - | 20 | - | - |
| ගණකාධිකාරි | - | 1 | - | - | - | 2 | - | 1 |
| සංවර්ධන නිලධාරි | - | 5 | - | 38 | 40 | - | 7 | - |
| සෞඛ්‍ය කාර්ය සහායක | - | 4 | 102 | - | 322 | - | 24 | - |
| කම්කරු | - | - | - | 77 | - | 14 | - | 11 |
| කාර්යාල කාර්ය සහායක | - | 1 | - | 8 | - | 5 | - | 3 |
| වෙනත් | - | 8 | - | 26 | - | 35 | - | 6 |
| එකතුව | 1 | 24 | 102 | 725 | 392 | 325 | 31 | 130 |

### 6.12 <u>ඖෂධ කළමනාකරණය</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රත්නපුර මහ නගර සභා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ 2017 ජනවාරි 09 දින එන්නත් භෞතික පරීක්ෂාවේ දී එන්නත් ලේඛනයේ ශේෂය හා භෞතික ශේෂය අතර එන්නත් 624 ක ඌනතාවයක් සහ එන්නත් 287 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) පැල්මඩුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට අයත් ඖෂධ සැරහුම් ලේඛනය , ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය ලේඛනය, පවුල් සංවිධාන උපකරණ ලේඛනය හා එන්නත් ලේඛනය යනාදී තොග ලේඛන වල, තොග ලැබීම් හා නිකුත් කිරීම් යාවත්කාලීන කිරීම් 2016 නොවැම්බර් 05 දින වන විටත් සිදු නොවී

පැවතීම නිසා ප්‍රාදේශීය ඖෂධ සැපයුම් ඒකකයෙන් ලැබුණ ඖෂධ තොග ඒකක 705,745 ක් පොත්වලට ගෙන නොමැති බවට අනාවරණය විය.

(ඇ) පැල්මඩුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ තොග ලේඛන වල 2016 නොවැම්බර් 05 දිනට අවසාන වශයෙන් ඇතුළත් කර තිබූ ලැබීම් හා නිකුත් කිරීම් අනුව විගණනය විසින් ගණනය කළ ශේෂයන් සහ භෞතික තොගය සැසඳීමේ දී අයිතම 14 ක තොග ඒකක 1,476,661 ක ඌනතාවයක් සහ අයිතම 03 ක තොග ඒකක 15,449 ක අතිරික්තතාවයක් පැවතුණි.

(ඈ) ලියාපදිංචි සියලුම ගැබිනි මව්වරු හා කිරිදෙන මව්වරු වෙනුවෙන් ත්‍රිපෝෂ පැකට් 02 බැගින් මාසිකව බෙදාහැරීම සිදු කළ යුතු වුව ද, රත්නපුර මහ නගර සභා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ත්‍රිපෝෂ මාසික ප්‍රතිලාභී සහ තොග (එම්.බී.අයි) වාර්තාව අනුව පරීක්ෂා කරන ලද මාස 11 කට අදාළව ලියාපදිංචි ගැබිනි මව්වරුන්ගෙන් සියයට 3 සිට සියයට 89 දක්වා ප්‍රමාණයකට හා ලියාපදිංචි කිරිදෙන මව්වරුන්ගෙන් සියයට 29 සිට සියයට 85 දක්වා ප්‍රමාණයකට ත්‍රිපෝෂ බෙදා හැරීම සිදුකර නොතිබූ නමුත් 2016 නොවැම්බර් මස ත්‍රිපෝෂ මාසික ප්‍රතිලාභ සහ තොග (එම්.බී.අයි) වාර්තාව අනුව පැකට් 83 ක් කල් ඉකුත්වීම මත ඉවත් කර තිබුණි.

## 6.13 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබූ පළාත් මාර්ග සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කිලෝමීටර් 15 ක දිගකින් යුතු උඩවලව ජාතික වනෝද්‍යානයේ හඳගිරිය දෙවන පිවිසුම් මාර්ගය ඉදිකිරීමේදී ඍජු ශ්‍රම පැය පදනම යටතේ මාර්ගය දෙපස කැලය ශුද්ධ කර, මාර්ගය දෙපසින් ජලය බැස යාමට හැකි වන පරිදි මාර්ගයේ මුහුණත සහ දෙපස සැකසීම සිදුකළ යුතු වූ අතර 2016 දෙසැම්බර් 30 දින වන විට රු. 2,654,740 ක කළ වැඩ වටිනාකමකට අදාළ බිල්පත් විධායක ඉංජිනේරු බලංගොඩ විසින් නිර්දේශ කර තිබුණි.2017 ජනවාරි 05 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී කි.මී. 2 ක් සම්පූර්ණ වශයෙන් වැඩ නිමකර තිබූ අතර කි.මී 6.9 ක් පාර දෙපස කැළය පමණක් ශුද්ධ කර අර්ධ වශයෙන් නිම කර තිබූ බව නිරීක්ෂණය විය. නමුත් නිර්දේශ කරන ලද බිල්පත් අනුව ඉටු කරන ලද යන්ත්‍ර සූත්‍ර පැය ගණන සහ සත්‍ය වශයෙන් නිම කරන ලද වැඩ සඳහා යෙදවිය යුතු යන්ත්‍ර පැය ගණන සලකා බැලීමේදී යන්ත්‍ර පැය 349.08 ක් සඳහා රු. 1,332,780 ක් ඉටු නොකරන ලද වැඩ සඳහා ගෙවා තිබුණි.

(ආ) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ කෝමාරිකා කොන්ක්‍රීට් පාර දෙපස බොරළු යෙදීමේ ව්‍යාපෘතිය යටතේ මාර්ගයේ ආරක්ෂාව සහ ඉඩ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මාර්ගය දෙපස බොරළු යොදා තද කිරීම වෙනුවට, අනුමත නොවන පස් වර්ගයකින් පුරවා තිබුණි. තවද පස් ඝන මීටර් 1421.4 ක් වෙනුවෙන් රු.1,941,490 ක මුදලක් ගෙවීම් කර තිබුණද භෞතික පරීක්ෂාවේදී සත්‍ය වශයෙන්

තිබූ පස් ප්‍රමාණය ඝන මීටර් 1229.63 ක් වූ බැවින් ඝන මීටර් 191.77 ක් වෙනුවෙන් රු. 261,939 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද ඉහල ආදොළුව මාර්ගය, පහළ ආදොළුව මාර්ගය සහ මිරිස්වැල්පත පාසල් මාවත තාර යොදා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වල මාර්ග දෙපස අනුමත වර්ගයේ පස් යොදා තැලීම වෙනුවෙන් එකතුව රු.424,778 ක මුදලක් ගෙවා තිබුණ ද වැඩ අවසන් කර තිබූ මෙම කර්මාන්ත සම්බන්ධයෙන් සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී එම වැඩ විෂයන් ඉටුකර නොතිබුණි.තවද, ඉහත සඳහන් මිරිස් වැල්පත පාසල් මාවතෙහි දිග මීටර් 400 ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණද එම මාර්ගයෙහි සත්‍ය දිග මීටර් 375 ක් පමණක් බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව ඉටු නොකරන ලද මීටර් 25 ක් වෙනුවෙන් එකතුව රු.121,142 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණය යටතේ මුල් ඇඩියාවල ජයවීර මාවත, මලපලාව දංගහයාය මාර්ගය සහ බුරුත කන්ද වැව හරහා නින්දගම්පැලැස්ස මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතීන් වලදී කොන්ක්‍රීට් තලය දෙපස අනුමත වර්ගයේ පස් යොදා තලා සකස් කිරීම වෙනුවෙන් රු.163,937 ක් ගෙවා තිබුණද වැඩ අවසන් කර තිබූ මෙම කර්මාන්ත භෞතික පරීක්ෂාවේදී එම වැඩ විෂයය ඉටුකර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද, ඉහත සඳහන් මලපලාව දංගහයාය මාර්ගය සඳහා රු. 1,893,002 ක් හා බුරුත කන්ද වැව හරහා නින්දගම්පැලැස්ස මාර්ගය සංවර්ධනය සඳහා රු. 1,447,763 ක් වැයකර තිබුණ ද එම මාර්ග වල ඉදිකිරීම් ප්‍රමිතිය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සංචාරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් කොන්ක්‍රීට් යොදා වැඩිදියුණු කරන ලද දිග මීටර් 206.4 ක් වූ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් ගගේයාය ඇල අද්දර පාරෙන් දිග මීටර් 34.1 ක ප්‍රමාණයක් තනි නිවසක් ඇති පෞද්ගලික ඉඩමක් තුළ ඉදිකර තිබුණු අතර ඒ සඳහා රු. 286,508 ක් වැය කර තිබුණි.

**6.14** **<u>බැංකු සැසඳුම්</u>**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාව යටතේ වූ විවිධ ආයතනවල බැංකු ගිණුම් මගින් නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06ක කාලයක් ඉක්මවූ එකතුව රු.7,176,904 ක් වූ චෙක්පත් 134 ක් සම්බන්ධයෙන් සබරගමුව පළාත් මූල්‍ය රීති 283.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර,මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ එකතුව රු.185,664 ක් වූ තැන්පතු 33 ක් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 03 කට අදාළ හඳුනා නොගත් හර කිරීම්වල එකතුව රු.98,270 ක් වූ අතර, බැංකු ගිණුම් 06 කට අදාළව හඳුනා නොගත් බැර කිරීම්වල එකතුව රු. 770,004 ක් විය.

## 07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂයේදී එක් අමාත්‍යාංශයක් හා එක් දෙපාර්තමේන්තුවක් විගණන හා කළමනාකරණ කමිටු 02 බැගින් ද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 25 ක් විගණන හා කළමනාකරණ කමිටු 03 බැගින් ද පවත්වා තිබුණි.

### 7.2 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රධාන අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 7.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු, මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා පරිගණක මිලදී ගැනීමේදී සිදුව තිබූ අක්‍රමිකතා හේතුවෙන් සභා අරමුදලට රු.7,961,213 ක අලාභයක් සිදුව තිබීම පිළිබඳව 2016 ඔක්තෝබර් 04 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බාහිර ආයතන මගින් සිදු කෙරෙන පරීක්ෂණ වලට අමතරව අභ්‍යන්තර පරීක්ෂණද නිසි පරිදි සිදු විය යුතු බවට අවධාරණය කර තිබුණද 2017 ජුනි 15 දින තෙක් එම නියෝගය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් ගිණුම් කාරක සභාවේ සාකච්ඡා කරන ලද 2001 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ වර්ෂ 12කට අදාළ විගණකාධිපති වාර්තාවන් හි ඇතුළත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 08 කට අදාළ විගණන ඡේද 100 ක් සම්බන්ධයෙන් අදාළ නිවැරදි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

## 08. පද්ධති හා පාලනය

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සබරගමුව පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය හා මූල්‍ය පාලනය.
(ආ) ආදායම් කළමනාකරණය.
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) මානව සම්පත් කළමනාකරණය.
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය.
(ඊ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
(උ) පාසල් කළමනාකරණය.
(ඌ) රෝහල් කළමනාකරණය.